සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන හා ඌණ උපයෝජන
රාජ්‍ය සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார, நுண்நிதிய, சுயதொழில், வியாபார அபிவிருத்தி மற்றும்
கீழுழைப்பு பயன்பாட்டு அரச வளங்கள் அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment, Business
Development and Underutilized State Resources Development

මගේ අංකය / எனது இல / My No: DSD/HO/05/MF/01/චක්‍රලේඛ
ඔබේ අංකය / உமது இல / Your No: ..............................
දිනය / திகதி / Date: 2021.02.18

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ :- 2021/03**

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති විධායක කමිටු/ බැංකු පාලක මණ්ඩල සභාපතිවරුන්,
සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිති / සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්.

**<u>සමෘද්ධි ප්‍රජාමූල බැංකු සාමාජිකයින්ගේ විදුලිය, ජලය සහ සනීපාරක්ෂක කටයුතු වැනි යටිතල පහසුකම් සලසා ගැනීම සඳහා "සමෘද්ධි ආලෝක" ණය වැඩසටහන හඳුන්වාදීම.</u>**

01. සමෘද්ධි සහනාධාරලාභී ඇතුළු අඩු ආදායම්ලාභීන් වන බැංකු සාමාජිකයන්ට 2021අයවැය යෝජනා යටතේ ගෘහස්ථ විදුලිය ලබාදීමට සැලසුම් කර ඇත. ඒ සඳහා දැනට ගෘහස්ථ විදුලිය නොමැති පවුල් පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කර ඇත.

මෙම සමීක්ෂණයෙන් තෝරා ගන්නා ප්‍රතිලාභීන් සඳහා ලංකා විදුලි බල මණ්ඩලය ඉදිරියේදී විදුලි සම්බන්ධතා ලබාදීමට කටයුතු කරන අතර, ඒ සඳහා සූදානම් වීමට නිවසෙහි අභ්‍යන්තර විදුලි රැහැන් ඇදීම ඇතුළු අනෙකුත් කටයුතු සඳහා දැරීමට සිදුවන වියදම් සඳහා සහන පොළිය මත ණය මුදලක් ලබාදීමට පියවර ගෙන ඇත.

එමෙන්ම ජාතික ජලසම්පාදන මණ්ඩලය විසින් සපයන ජල සම්බන්ධතා ලබා ගැනීමටත්,තවද සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කර ගැනීමට අවශ්‍ය උදවු ලබාදීම වෙනුවෙන් ද ණය පහසුකම් ලබා දීමටත් මෙම උපදෙස් නිකුත් කරනු ලබන බව කාරුණිකව දන්වමි.

02. ඉලක්ක පිරිස.

සමෘද්ධි සහනාධාරලාභී සහ අඩු ආදායම්ලාභී සමෘද්ධි බැංකු සාමාජිකයින්.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

03. ණය ලබාදෙන කාරණාවන්, වාර්ෂික පොලි අනුපාතය, උපරිම ණය මුදල, ආපසු ගෙවීම් කාලය සහ ඇප සුරකුම්.

| කාරණාව | උපරිම ණය මුදල (රු) | වාර්ෂික පොලී අනුපාතය (හීනවන ශේෂ ක්‍රමයට) | ආපසු ගෙවීම් කාලය (මාස) | ඇප සුරකුම් |
|---|---|---|---|---|
| ගෘහස්ථ විදුලි රැහැන් ඇදීම, ජල සම්බන්ධතා ලබාගැනීම සහ සනීපාරක්ෂක කටයුතු සංවර්ධනය වෙනුවෙන් | 20,000/- | 4% | 36 | කුඩා කණ්ඩායම් ඇප |

04. මාසික සමාන වාරික අයකර ගැනීමේදී ඇමුණුම් 01 හි සඳහන් වගුව භාවිතා කල හැක. ණය මුදල සහ කාලය වෙනස් වනවිට අදාල වගුවේ මුදල හා කාලය වෙනස් කර වාරික සකස් කර ගත යුතු වේ.

05. ණය ඉල්ලුම්පත්‍ර සහ අනිකුත් ලියවිලි.

දැනට හඳුන්වා දී ඇති ණය ඉල්ලුම් පත්‍රය භාවිත කල යුතු අතර, අනෙකුත් කටයුතු සඳහා දැනට භාවිතා කරන ලියවිලි භාවිතා කළ යුතු වේ.

06. ණය අනුමත කිරීම සහ මුදාහැරීම.

I. පාලක මණ්ඩල ආවරණ අනුමැතියට යටත්ව ණය නිකුත් කළ යුතුවේ.
II. පොදු ලෙජරයේ <u>කේත අංක 3128</u> යටතේ ලැබිය යුතු ණය ගිණුම "<u>සමෘද්ධි ආලෝක</u>" නමින් නව ගිණුමක් ආරම්භ කර ණය මුදල සටහන් කල යුතුය.
III. මෙම ණය වැඩසටහන සඳහා ද ණය සංරක්ෂණ ආවරණයක් සමෘද්ධි බැංකු විසින් ලබාගත යුතුවේ.
IV. "සමෘද්ධි ආලෝක" ණය වැඩසටහන යටතේ ලබාදෙන ණය මුදල් ගිවිසුම්ගත පරිදි අය කරගත යුතුවේ. කෙසේ නමුත් සමෘද්ධි බැංකු පරිගණක මෘදුකාංගයේ තාක්ෂණික අවශ්‍යතාවය අනුව <u>කේත අංක 3227</u> යටතේ බොල් ණය ගිණුම - සමෘද්ධි ආලෝක නමින් ගිණුමක් ආරම්භ කළ යුතුය.

07. සමාජ සංවර්ධන සහකාර, ක්ෂේත්‍ර සහකාර සහ වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් විසින් මෙම නිවාස විදුලි රැහැන් ඇදීම සඳහා වෘත්තීය සේවා සපයන පුද්ගලයන් (වෘත්තීය පුහුණු අධිකාරියේ පුහුණුව ලබා ගත් තරුණ /තරුණියන් වැනි) සම්බන්ධ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ලෙසද කාරුණිකව දන්වා සිටිමි.

08. දැනට විදුලිය නොමැති බවට හඳුනාගෙන ඇති පවුල්වල ට්‍රාන්ස්පෝමරයේ සිට අදාල නිවස දක්වා ඇති දුර ප්‍රමාණය ඉතා ආසන්නව (මීටර් 500 වැනි ) ඇති සමෘද්ධි ප්‍රතිලාභින් සඳහා විදුලිය ලබාගැනීමට අවශ්‍ය අභ්‍යන්තර විදුලි රැහැන් ඇදිමේ කටයුතු කඩිනමින් නිම කරවා ගැනීමට අවශ්‍ය සහාය ඉහත සඳහන් නිලධාරින් විසින් ලබාදිය යුතුවේ. එසේ කටයුතු කිරීම තුලින් මෙම ණය වැඩසටහන සම්බන්ධ කර ගනිමින් මුල් අදියරේදීම සමෘද්ධි ප්‍රතිලාභින්ට විදුලිය ලබාගැනීමට හැකියාව ලැබෙනු ඇත.

09.     මෙම ණය වැඩසටහන යටතේ ණය ලබාදීම 2021.12.31 දින දක්වා ක්‍රියාත්මක වන බව දන්වන අතර, අනිකුත් උපදෙස් සඳහා දැනට නිකුත් කර ඇති ණය චක්‍රලේඛ උපදෙස් තවදුරටත් වලංගු කරගත යුතු බව ද සඳහන් කරමි.

10.     විදුලිය නොමැති සැමට විදුලිය ලබාදීමට රජය ගෙන ඇති තීරණය ක්‍රියාත්මක කිරීමට ඔබ දක්වන සහාය අගය කරමි.

ආර්.පී.බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

**පිටපත් :-**

1. ලේකම් - සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා, ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය. - කා.දැ.ස.
2. දිස්ත්‍රික් ලේකම්/ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
3. දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය. - දැ.ස. හා අ.ක.ස.
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
6. ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය. - කා.දැ.ස.
7. දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අ.ක.ස.